# ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව
## රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය

**<u>ප්‍රජා මූල සංවිධානය සතු අපරිමිත ශක්තිය</u>**

රත්නපුර දිස්ත්‍රික්කය නිරන්තරයෙන් ආපදාවට ලක්වන දිස්ත්‍රික්කයකි. ප්‍රජා මූල සංවිධාන 511 මඟින් දිස්ත්‍රික්කයේ 126000 නිවාස සඳහා ජලය ලබා දීමේ භාරදූර කාර්යභාරය ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය වෙත පැවරී ඇත.



2019 වසර රත්නපුර දිස්ත්‍රික්කයට අමතක නොවන විශාල ආපදාවකට මුහුණ දෙන්නට විය. මහා ගංවතුර මිනිසුන් සියගණනක් බිලිගත් අතර නිවාස හා මිනිසුන්ගේ දේපල විශාල වශයෙන් විනාශ විය. ජිවිතයට මුහුණ දීම මහා අභියෝගයක් විය. මේ අතර අප ප්‍රජා මූල සංවිධාන 53ක ජනතාව විශාල අසරණභාවයකට පත්ව ඇති බව අපවෙත පණිවිඩ ගල එන්නට විය. කලවාන අයගම ප්‍රදේශ වලට සියලු සැපයුම් ගුවන් මඟින් පමණක් විය. මාර්ග විනාශ වීම එයට හේතුවයි. ක්ෂණිකවම ක්‍රියාත්මක වූ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සියලු දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලය වෙත මෙම විපත පිලිබඳ දැනුවත් කළේය.

රත්නපුර මේ මහා ගංවතුරෙන් විපතට පත්වූවන්ට පළමුව පිසූ ආහාර, ජලය හා වියලි ආහාර ලබා දීම ආරම්භ කල අතර මේ සඳහා දිස්ත්‍රික් කාර්යාල හා රත්නපුර දිස්ත්‍රික්කයේ ආපදාවට ලක්නොවූ ප්‍රජා මූල සංවිධාන අපවෙත විශාල සහයෝගයක් ලබාදුනි. පළමුව පිසූ ආහාර ලබාදීමටත්, ළිං පිරිසිඳු කර ගැනීම සඳහා ක්ලෝරීන් ලබාදීම සිදුකළේය. හාල්, පොල්, ඇඳුම්, කිරිපිටි, සනීපාරක්ෂක භාණ්ඩ, සබන්, දරුවන්ට අවශ්‍ය බොහෝ දේවල් නොපමාව ලොරි විශාල සංඛ්‍යාවක් අපට ලබාදෙන ලදී. මොනරාගල, මහනුවර, කෑගල්ල, අනුරාධපුර, මාතලේ ආදී දිස්ත්‍රික්ක වල අපේ සංවිධාන සුවිශාල පරිත්‍යාග ප්‍රමාණයක් ලබාදුන් අතර අප කාර්යාලයේ පරිත්‍යාග පාර්සල් කිරීම සඳහා ප්‍රජා මූල සංවිධාන සාමාජිකයින් සියගණනක් දිනපතා සේවය ලබාදෙමින් හා වාහනද භාණ්ඩ ප්‍රවාහනය සඳහා අපවෙත ලැබුණු අතර වියලි ආහාර රු. මිලියන 30කට ආසන්න ප්‍රමාණයක් අප ප්‍රජා මූල සංවිධාන වල විපතට පත් ජනතාව වෙත ලබාදීමට අපට හැකිවිය.

ප්‍රජා මූල සංවිධාන වල ආපදාවට ලක්වූවන්ට අප විසින් කල සේවය පිලිබඳ දිස්ත්‍රික්කයේ ඉහල රාජ්‍ය නිලධාරීන් මෙන්ම දේශපාලන නායකත්වයේද ප්‍රසාදයට ලක්වීමේ ප්‍රතිපලයක් ලෙස ආපදාවට ලක්වූ සියලු සංවිධාන වල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය සම්පත් අප ප්‍රජා මූල සංවිධාන වෙත ලබාදුනි. World vision ආයතනය සුවිශේෂ සහයක් ලබා දුනි. මෙම වැඩසටහන ප්‍රජා මූල සංවිධාන ඒකාබද්ධ වූ විට මොනතරම් කාර්යභාරයක් ක්ෂණිකව සිදුකල හැකිද යන්න මොනවට පැහැදිලි කරගත හැකි සුවිශේෂී අවස්ථාවකි.

**පිටපත** : ස්ථාන භාර නිලධාරී (රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය)